# 462 පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 462/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 16/03/2024<br>පැය 1415 |

**මාධ්‍ය නිවේදනය**

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

**01. මනුෂ්‍ය ඝාතනයක් - වැලිගම පොලිස් වසම.**

2024.03.16 වන අද දින උදෑසන කාලයේ වැලිගම පොලිස් වසමේ පෙම්උයන්කන්ද ප්‍රදේශයේදී පුද්ගලයෙකුට තියුණු ආයුධයකින් පහරදී ඝාතනය කර ඇති බවට වැලිගම පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 38 ක් වූ පරගල්ල, මිරිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු හා සැකකරු සංචාරක හෝටල් දෙකක් පවත්වාගෙන යන අතර අද දින හෝටල් දෙකට යාබදව වෙරළ ආසන්නයේ පිහිටි ගසක් කැපීම හේතුවෙන් ඇතිවූ ආරවුලක් දුරදිග යාමෙන් සැකකරුගේ බිරිඳ දරුවන් හා ඥාතීන් විසින් මරණකරුට පහරදී ඇති අතර එම අවස්ථාවේදී සැකකරු විසින් තියුණු ආයුධයකින් පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බවට අනාවරණය වී ඇත.

මෘත ශරීරය මාතර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා වැලිගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. දියේ ගිලී පුද්ගලයෙකු මියයාමක් - කිරිඇල්ල පොලිස් වසම.**

2024.03.15 වන දින සවස් කාලයේදී කිරිඇල්ල පොලිස් වසමේ ඇල්ල දේවාලය අසල කළුගඟේ නීතිවිරෝධි ලෙස පතල් කැණීම් සිදු කරමින් සිටි පුද්ගලයෙකු දියේ ගිලී ඉංගිරිය රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇති බවට 2024.03.16 වන අද දින කිරිඇල්ල පොලීසියට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 54ක් වූ විතානකන්දගම, කරදන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ඉංගිරිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කිරිඇල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

03. දියේ ගිලී පුද්ගලයෙකු අතුරුදහන්වීමක් - මරදන්කේණි පොලිස් වසම.

2024.03.16 වන අද දින අළුයම් කාලයේදී මරදන්කේණි පොලිස් වසමේ තාලයඩි මුහුදු තීරයේ තෙප්පමක් ආධාරයෙන් මසුන් ඇල්ලීම සඳහා මුහුදු ගොස් සිටි පුද්ගලයෙකු දියේ ගිලී අතුරුදහන්ව ඇති බවට මරදන්කේණි පොලීසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 61ක් වූ මරදන්කේණි උතුර, තාලයඩි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අතුරුදහන්වූ අය සොයා නාවික හමුදා කිමිදුම්කරුවන් හා මරදන්කේණි පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

04. **මාරක රිය අනතුරක් - ජාඇල පොලිස් වසම.**

2024.03.16 වන අද දින අළුයම් කාලයේ ජාඇල පොලිස් වසමේ ඒකල, ජාඇල මාර්ගයේ කණුවන දුම්රිය හරස් මාර්ගය ආසන්නයේදී හඳුනා නොගත් රථයක පාපැදිකරුවෙකු ගැටී පාපැදිකරු එම ස්ථානයේම මිය ගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 35ක්වූ වැලිගම්පිටිය, ජාඇල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය රාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සිදුකර පලාගිය වාහනය සහ සැකකාර රියදුරු අත්අඩංගුවට ගැනීම සඳහා ජාඇල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**